පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය **10**

# දෙවන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..............................................
..........................................................................................

කාලය : පැය 01 යි.

## ඉතිහාසය - I

**සැලකිය යුතුයි :**

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

▪ **ප්‍රශ්න අංක01 - 40 දක්වා ඇති ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ශ්‍රී ලංකා ඉතිහාසය අඛණ්ඩව ලියවී ඇති වඩාත් පැරණි සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,

1) දීප වංශය
2) බෝධි වංශය
3) ථූප වංශය
4) මහා වංශය

02. මෙරට පැරණි සාහිත්‍ය මූලාශ්‍ර අතර ප්‍රශස්ති කාව්‍යක් ලෙස සැලකෙන්නේ,

1) ඉංග්‍රීසි හටන යි.
2) පැරකුම්බා සිරිත යි.
3) රාජාවලිය යි.
4) නිකාය සංග්‍රහය යි.

03. ශ්‍රී ලංකාවට නොපැමිණ විවිධ පුද්ගලයන්ගෙන් අසා දැනගත් තොරතුරු ඇසුරින් ලියන ලද විදේශීය සාහිත්‍ය මූලාශ්‍රයකි.

1) පාහියන් භික්ෂුවගේ දේශාටන වර්තාව
2) ඉබන් බතූතාගේ දේශාටන වාර්තාව
3) හියුං - සියෑං හිමිගේ දේශාටන වාර්තාව
4) රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය

04. පොළොන්නරු රාජ්‍යය සමයේ දී භාවිත කෙරුණු කාසි වර්ගයක් වන්නේ,

1) ඇතා හා ස්වස්ථික කාසිය යි.
2) ලක්ෂ්මී කාසිය යි.
3) කහාපණ කාසිය යි.
4) තඹ මස්ස කාසිය යි.

05. අභිලේඛන ගණයට අයත් වල්ලිපුරම් රන් සන්නස කරවන ලදැයි සැලකෙන්නේ,

1) වසභ රජු ය.
2) නිශ්ශංකමල්ල රජු ය.
3) පළමුවන විජයබාහු රජු ය.
4) අමණ්ඩගාමිණී අභය රජු ය.

Education NCP - www.edncp.lk
EXAMRESULTS.LK

06. ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන ඉරණමඩු සැකැස්ම තැම්පත් වූ භූ අවධිය වන්නේ,

1) ප්ලයිස්ටොසීන යුගයේ කෙටි උණුසුම් කාලයයි.

2) ප්ලයිස්ටොසීන යුගයේ අධික වර්ෂාව සහිත කාලයයි.

3) ප්ලයිස්ටොසීන යුගයේ දිගු උණුසුම් කාලයයි.

4) ප්ලයිස්ටොසීන යුගයේ අඩු වර්ෂාව සහිත කාලයයි.

07. රාවණා ඇල්ල නම් ප්‍රාග් ඓතිහාසික ස්ථානය අයත් පරිසර කලාපය වන්නේ,

1) ශුෂ්ක කලාපය යි. 2) තෙත් කලාපය යි.

3) කඳුකර වියළි අතරමැදි කලාපය යි. 4) පහතරට අතරමැදි වියළි කලාපය යි.

08. මීට වසර 125 000 කට පෙර ගල් යුගයට අයත් සාක්ෂි හමුවන පැරණිතම ස්ථානයකි.

1) බූන්දල 2) පතිරාජවෙල

3) කුරුවිට බටදොඹ ලෙන 4) අත්තනගොඩ අළුලෙන

09. කුරුණෑගල පිහිටි ගනේකන්ද විහාරයේ ගල්ලෙනේ කොටා ඇති සෙල්ලිපියේ "අවරණ" යන වචනයෙන් අදහස් කරන්නේ,

1) බිසෝ කොටුව යි. 2) වැව් බැම්ම යි. 3) කළිඟු බැම්ම යි. 4) අමුණ යි.

A - බෙරගල සුසාන භූමිය B - ඉබ්බන්කටුව සුසාන භූමිය

C - ගල්සොහොන් කනත්ත සුසාන භූමිය D - යටිගල්පොත්ත සුසාන භූමිය

10. ඉහත තොරතුරු අතරින් ශිලා මංජුසා සොහොන් සම්ප්‍රදායට පමණක් අයත් සුසාන භූමි දැක්වෙන පිළිතුර වන්නේ,

1) A, B, C වේ. 2) A, C, Dවේ.

3) B, C, Dවේ. 4) B, A,Dවේ.

11. පැරණි ගමක ජීවත් වූ දිළිඳු පුද්ගලයෙකු ගමිකගෙන් ණයට වී මල්ලක් ඉල්ලා ගත් බව දැක්වෙන සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,

1) ජාතකට්ඨ කතාව යි. 2) සමන්ත පාසාදිකාව යි.

3) දම්පියා අටුවා ගැටපදය යි. 4) වංසත්තප්පකාසිනිය යි.

12. පහත A, B, C, D වලින් දැක්වෙන සිදුවීම් හා සම්බන්ධ රජවරුන් පිළිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ,

A - පනාකඩුව තඹ සන්නස කරවීම.

B - තිස්ස මහාරාම වැව ඉදි කිරීම.

C - ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරයට නායකත්වය ලබා දීම.

D - සෑගිරි ඇමතිට යාපනය ප්‍රදේශයේ පාලනය පැවරීම.

1) වසභ , දුටුගැමුණු , ඉහළනාග , පළමුවන විජයබාහු

2) පළමුවන විජයබාහු , ඉළනාග , දුටුගැමුණු , වසභ

3) වසභ , දුටුගැමුණු , පළමුවන විජයබාහු , ඉළනාග

4) ඉළනාග , පළමුවන විජයබාහු , වසභ , දුටුගැමුණු



Education NCP - www.edncp.lk

13. අතීතයේ ප්‍රාදේශීය පාලකයන් "දූහතර රජ" නමින් හඳුන්වා ඇති සෙල්ලිපිය පිහිටි ස්ථානය වන්නේ,

1) යටහ ලෙන බෞද්ධ විහාරයේ ය. 2) මාතලේ ඇඹුල් අඹේ නම් ස්ථානයේ ය.

3) සිතුල්පව්ව විහාරයේ ය. 4) කළුදිය පොකුණ නම් ස්ථානයේ ය.

14. පහත A හා B තීරු නිවැරදි ව ගලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| A තීරුව | | B තීරුව |
|---|---|---|
| 1. | අස දෙක | P - වෙළඳ කටයුතු භාර ප්‍රධානියා |
| 2. | හති අදෙක | Q - කාසි අච්චු ගැසීමේ අංශ ප්‍රධානියා |
| 3. | රූප අදෙක | R - අශ්ව අංශයේ ප්‍රධානියා |
| 4. | පන අදෙක | S - ඇත් අංශයේ ප්‍රධානියා |

1) S, R, P, Q ය. 2) Q, R, S, P ය.

3) R, S, Q, P ය. 4) R, S, P, Q ය.

15. පුරාණ සාහිත්‍ය මූලාශ්‍රය වල ඇතැම් ගම් වැටකින් ආරක්ෂා කර තිබූ බව සඳහන් වේ. එවැනි ගම් එම මූලාශ්‍රයවල හඳුන්වා ඇත්තේ,

1) ඔළ ගම් ලෙස ය. 2) නියම් ගම් ලෙස ය.

3) පරික්ඛිත්ත ගම් ලෙස ය. 4) අපරික්ඛිත ගම් ලෙස ය.

16. "උපසග්ගරෝග නාස" නම් විශේෂ රෝහල් ඉදි කරවූ පාලකයා වන්නේ,

1) පස්වන මහින්ද රජු ය. 2) පළමු වන උපතිස්ස රජු ය.

3) බුද්ධදාස රජු ය. 4) හතරවන කාශ්‍යප රජු ය.

17. භෙන් හැඳින්වීම සඳහා **සෙහෙන්, සේන්, පිටබිම්** යන යෙදුම් සඳහන් වූ මූලාශ්‍රයයන් අනුපිළිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ,

1) බූත්සරණ , උම්මග්ග ජාතකය , සෙල්ලිපි

2) සෙල්ලිපි , බූත්සරණ , උම්මග්ග ජාතකය

3) බූත්සරණ , සෙල්ලිපි , උම්මග්ග ජාතකය

4) උම්මග්ග ජාතකය , බූත්සරණ , සෙල්ලිපි

18. හයවන අග්ගබෝධි රජු සමයේ විසි වතාවක් මෙරටින් රාජ තාන්ත්‍රික දූතයන් යැවූ රට වන්නේ,

1) ඉන්දියාව යි. 2) චීනය යි.

3) අරාබිය යි. 4) රෝමය යි.

19. " කැති අඬ හා කෙටු කනබ " යන බදු වර්ග අහෝසි කළ රජු වන්නේ,

1) පළමුවන විජයබාහු රජු ය. 2) සහස්සමල්ල රජු ය.

3) නිශ්ශංකමල්ල රජු ය. 4) පළමුවන පරාක්‍රමබාහු රජු ය.

Education NCP - www.edncp.lk

20. පහත A හා B තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| **A තීරුව** | | **B තීරුව** | |
|---|---|---|---|
| 1. | කම්මල් කරුවා | A | - තුලාධාර |
| 2. | රන් කරුවා | B | - කුඹකර |
| 3. | මැණික් කරුවා | C | - කබර |
| 4. | මැටි කරුවා | D | - මැණිකර |

1) C, A, D, B ය. 2) C, B, D, A ය.

3) D, A, C, B ය. 4) C, D, B, A ය.

21. දන්ත ධාතුන් වහන්සේ රැගෙන හේමමාලා කුමරිය හා දන්ත කුමරු මෙරටට ගොඩබට වරාය වන්නේ,

1) දඹකොළ පටුන යි. 2) ලංකා පටුන යි.

3) මහාතිත්ථ යි. 4) ගෝකණ්ණ තිත්ථ යි.

22. දකුණු පළාතේ බෝවත්තේගල නම් ස්ථානයේ ඇති සෙල්ලිපියේ සඳහන් " කබොජ මහ පුගිය " යන වෙළෙඳ ශ්‍රේණිය හා සම්බන්ධ වෙළෙඳුන් අයත් රට වූයේ,

1) පාකිස්ථානය යි. 2) මිසරය යි.

3) ඇෆ්ගනිස්ථානය යි. 4) අරාබිය යි.

- A - දීප වංශය D - බාලාවබෝධය
  B - සාරප්‍යදීපනී E - මුවදෙව්දාවත
  C - ජාතකීහරණය F - සියබස්ලකර

23. ඉහත කෘති අතරින් සංස්කෘතික භාෂාවෙන් ලියවී ඇති කෘති ඇතුළත් පිළිතුර වන්නේ,

1) C හා D ය. 2) A හා B ය.

3) E හා F ය. 4) B හා C ය.

24. පූර්ව ඓතිහාසික යුගයට අයත් පිටත රතු පැහැයෙන් හා ඇතුළත කළු පැහැයෙන් යුක්ත ලෙස නිමවා ඇති මැටි බඳුන් හඳුන්වන්නේ,

1) නවනීත මැටි බඳුන් ලෙසයි.

2) වර්ණාලේපිත මැටි බඳුන් ලෙසයි.

3) ගුරු ගල් මගින් සකසා ගත් රතු පැහැයට හුරු මැටි බඳුන් ලෙසයි.

4) කාලරක්ත වර්ණ මැටි බඳුන් ලෙසයි.

25. පුරාණ යකඩ නිස්සාරණ තාක්ෂණය යටතේ ස්වාභාවික සුළං බලය ලෙස යොදාගත් උදුන් භාවිතා කළ බවට සාක්ෂි හමු වූ ස්ථානයක් වන්නේ,

1) බෙරගල ය. 2) අළකොළ වැව ය.

3) දෙහිගහ ඇලකන්ද ය. 4) බලංගොඩ සමනල වැව ය.

Education NCP - www.edncp.lk

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| A | - | පැල | C | - | ආංගුල | E | - | ධරණ |
| B | - | ගුන්ජා | D | - | අමුණ | | | |

26. ඉහත මිනුම් දඬු අතරින් අවකාශය මැනීම සඳහා පමණක් යොදා ගත මිනුම් වන්නේ,

1) A හා C ය. 2) A හා D ය.

3) B හා E ය. 4) E හා D ය.

27. ඉහත මිනුම් දඬු අතරින් බර මැනීම සඳහා පමණක් භාවිත කළ මිනුම් වන්නේ,

1) A හා B ය. 2) C හා D ය.

2) B හා E ය. 4) D හා E ය.

28. " පීඩන ශල්කනය " යනුවෙන් හැඳින්වෙන්නේ,

1) පොළොවේ යම් සීමාවක් තුළ පවතින සියලු දේ ආකර්ෂණය කර ගැනීමේ බලයයි.

2) වෙර යොදා බලයක් යෙදීමෙන් ගල් පතුරු ගලවාගෙන මෙවලම් තැනීමේ තාක්ෂණය යි.

3) විද්‍යුත් ශක්තිය චාලක ශක්තිය බවට පරිවර්තනය කර ගැනීමේ තාක්ෂණයයි.

4) යම් වස්තුවක් පොළොවට ලම්භාකාර වීමේ දී පොළොව මත ඇති කරන පීඩනය අවම වීමයි.

29. වැවක ජලය නිකුත් කිරීමේ දී වැව් බැම්මට ඇතිවන පීඩනය පාලනය කිරීම සඳහා ඉදිකොට ඇති අංගයක් වන්නේ,

1) ගොඩ සොරොව්ව යි. 2) පිටවානයි.

3) මඩ සොරොව්ව යි. 4) බිසෝ කොටුවයි.

30. ඓතිහාසික යුගයේ මෙරට පැවති තිරස් සමාජ ධූරාවලියට අයත් නොවන තනතුර වන්නේ,

1) රජු ය. 2) ඇමතිවරු ය. 3) සේනාපතිවරු ය. 4) භාණ්ඩාගාරික ය.

- **පහත වගුවේ ඇති තොරතුරු ඇසුරින් 31, 32, 33 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| රජු | සෙල්ලිපිය | සඳහන් කරුණ |
|---|---|---|
| A - හතරවන මහින්ද | D - බුද්ධන්නේහෙල සෙල්ලිපිය | G - නිසි කළට සී සෑම නොකරන පුද්ගලයන්ගෙන් බදු අය කළ යුතු බව. |
| B- තුන්වන උදය | E- කොණ්ඩවට්ටවාන් වැම් ලිපිය | H- සොරකම් කිරීම, මිනී මැරීම ආදී වරදවල් සඳහා දිය යුතු දඬුවම්. |
| C- පස්වන කාශ්‍යප | F- වේවැල්කැටිය සෙල්ලිපිය | I- කැලෑවල ගස්කොළන් නොකැපිය යුතු බව. |

31. වන සම්පත් ආරක්ෂා කර ගැනීම පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,

1) A, D, I ය. 2) B, E, G ය. 3) B, D, I ය. 4) C, E, I ය.

32. " ගෘහ දණ්ඩ " නම් බද්දක් පැනවීම සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,

1) A, F, H ය. 2) A, E, I ය. 3) B, F, H ය. 4) C, D, G ය.

33. කෘෂි කාර්මික කටයුතුවලදී ස්වාභාවික පරිසරයට සිදුවන හානිය අවම කිරීම සඳහා පැන වූ නීතියක් පිළිබඳ සඳහන් පිළිතුරු කාණ්ඩය වන්නේ,

1) A, D, G ය. 2) C, E, G ය. 3) B, E, I ය. 4) C, F, H ය.

Education NCP - www.edncp.lk

34. අනුරාධපුර රාජධානිය පාලනය කළ අවසන් රජු ලෙස සැලකෙන්නේ,

1) හතරවන මිහිදු රජු ය.
2) පළමු වන විජයබාහු රජු ය.
3) පස්වන කාශ්‍යප රජු ය.
4) පස්වන මිහිදු රජු ය.

35. දෙමාපියන් විසින් තම දියණිය සූප ශාස්ත්‍රයෙහි ප්‍රගුණ කළ යුතු බව සඳහන් වන පැරණි සාහිත්‍ය මූලාශ්‍රය කුමක් ද ?

1) සද්ධර්මාලංකාරය
2) දම්පියා අටුවා ගැටපදය
3) සහස්සවත්ථුපකරණය
4) රසවාහිනිය

36. සහල් පිටි පල් කොට සාදා ගත් ආහාරය අතීතයේ හඳුන්වා ඇත්තේ,

1) නියඹලාව නමිනි.
2) කාඩි ඇඹුල නමිනි.
3) අත්සුණු නමිනි.
4) හම්බු නමිනි.

37. පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමෙන් පසු මිනිපේ නම් ස්ථානයේ ආරක්ෂිත බලකොටුවක් පිහිටුවා ගත් ප්‍රාදේශිය පාලකයා වන්නේ,

1) විජයබාහු ය.
2) සුභ සෙනෙවි ය.
3) සංඛ සෙනෙවි ය.
4) බුවනෙකබාහු ආදිපාද ය.

38. " කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත " යන උපාධි නාමයෙන් පිදුම් ලැබූ පාලකයා වන්නේ,

1) පළමුවන පරාක්‍රමබාහු රජු ය.
2) හතරවන පරාක්‍රමබාහු රජු ය.
3) තුන්වන පරාක්‍රමබාහු රජු ය.
4) දෙවන පරාක්‍රමබාහු රජු ය.

39. පාලි භාෂාවෙන් පැවති පන්සිය පනස් ජාතක පොත සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද්දේ,

1) කුරුණෑගල යුගයේ දී ය.
2) ගම්පොළ යුගයේ දී ය.
3) දඹදෙණි යුගයේ දී ය.
4) කෝට්ටේ යුගයේ දී ය.

40. ගම්පොළ යුගයේ දී මෙරටට පැමිණ ශ්‍රී පාදස්ථානය වන්දනා කළ අරාබි ජාතික සංචාරකයා වන්නේ,

1) ඉබන් බතූතා ය.
2) අල් බලසූරි ය.
3) සුලෙයිමන් ය.
4) ඉබ්න් ශහ්රියර් ය.

Education NCP - www.edncp.lk

***

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 10

# දෙවන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..............................................
..........................................................................................

කාලය : පැය 03 යි.

## ඉතිහාසය - II

**සැලකිය යුතුයි :**

- **I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.**

Education NCP - www.edncp.lk

### I - කොටස

01. (අ) **පහත (I) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල සපයා ඇති ලංකා සිතියමෙහි ලකුණු කොට නම් කරන්න.**

i) කැළණි ගඟ, කුඹුක්කන් ඔය, නාච්චාදූව වැව, පරාක්‍රම සමුද්‍රය, බූන්දල, රාවනා ඇල්ල, දඹකොළ පටුන, දේව නගර, කෝට්ටේ, ගම්පොළ, ගෝවින්දමලය, පිදුරංගල (ල: 12)

ii) පහත A, B, C, D, E, F යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් හා ස්ථාන අනුපිළිවෙලින් ලියන්න.

A - මහාවංශයේ මුල් කොටස රචනා කරන ලද හිමි නම

B - ජනතාව විසින් අතහැර දමූ වැව්ගම් හැඳින්වූ නාමය

C - ඇළ මාර්ග මගින් එකට සම්බන්ධ කොට සකස් කරන ලද වැව් පද්ධතිය

D - පනාකඩුව තඹ සන්නසෙහි සඳහන් පරිදි පළමුවන විජයබාහු රජුට රැකවරණය සැළසූ ප්‍රාදේශිය නිළධාරියා

E - ජලාශවල ජීවත්වන පක්ෂීන් නොමැරිය යුතු බවට නීතියක් පනවන ලද රජතුමා

F - ක්‍රි. පූ. 250 පමණ කාලයේ සෙල්ලිපිවල පුරකමත නමින් හඳුන්වා ඇති නිළධාරියා

(ල: 06)

- **පහත A , B හා C යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ආ) **A**



i. මෙම පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.

ii. මොහු කිනම් ජාතිකයෙක් ද ?

iii. ඔහු ජීවත් වූ රට කුමක් ද ?

iv. මොහු විසින් රචනා කරන ලද කෘතිය නම් කරන්න.

(ල: 04)

**B**



i. මෙම රූපයෙන් දැක්වෙන ස්ථානය හඳුන්වන නම කුමක් ද ?

ii. මෙය අයත්වන කාලවකවානුව නම් කරන්න.

iii. මේවා භාවිතා කරන්නට ඇත්තේ කුමන කාර්යයක් උදෙසා ද ?

iv. සමාජයේ කුමන පිරිසක් වෙනුවෙන් මෙය භාවිතා කර තිබේ ද ?

(ල: 04)

**C**



i. මෙම රූපය හඳුනාගෙන නම් කරන්න.

ii. මෙය සොයාගන්නා ලද්දේ කුමන ප්‍රදේශයකින් ද ?

iii. මෙය නිර්මාණය සඳහා යොදාගත් තාක්ෂණික උපකරණය කුමන නමකින් හැඳින්වේ ද ?

iv. මෙය වර්ණ ගැන්වීම සඳහා භාවිත කළ අමුද්‍රව්‍ය නම් කරන්න.

(ල: 04)

## II - කොටස

02. i. සෙල්ලිපි ලියා ඇති ගල්වල ස්වරූපය අනුව ඒවා හැඳින්වීමට යෙදෙන නම් තුනක් ලියන්න. (ල: 03)

ii. සීගිරි චිත්‍ර වලින් හෙළිවන පැරණි සංස්කෘතික අංග හතරක් සඳහන් කරන්න. (ල: 04)

iii. පුරා විද්‍යා මූලාශ්‍ර ආරක්ෂා කරගැනීමට ඔබට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කර, කෙටියෙන් පැහැදිලි කරන්න. (ල: 05)

iv. සාහිත්‍ය මූලාශ්‍රයවල ඇති ප්‍රයෝජන තුනක් සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල: 06)

Education NCP - www.edncp.lk

03. i. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් පහත සඳහන් ස්ථාන පිහිටි පරිසර කලාප තුන පිළිවෙලින් ලියන්න.

A - මිනිහා ගල්කන්ද

B - අළිගල

C - පාහියන්ගල (ල: 03)

ii. පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්කර හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණ හතරක් ලියන්න.

(ල: 04)

iii. ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවන රටාව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල: 05)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යුහය කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ල: 06)

04. i මූලාශ්‍ර වල සඳහන් පහත යෙදුම්වල අර්ථය A B C අනුපිළිවෙලින් ලියන්න.

A - තොට බොජක

B - පොංවනි රජ

C - නර ඉසෙර (ල: 03)

ii. පැරන්නන් විසින් ඇළමාර්ග සම්බන්ධ කර ගනිමින් වැව් පද්ධතියක් සකස් කර ගැනීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ල: 04)

iii. දේවානම්පියතිස්ස රාජ්‍ය සමය ආගමික හා සංස්කෘතික වශයෙන් වැදගත් වන්නේ මන්දැයි කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල: 05)

iv. වසභ රජුගේ දේශපාලන, ආර්ථික හා ආගමික සේවාව බැගින් සඳහන් කොට කෙටියෙන් විස්තර කරන්න.

(ල: 06)

05. i. රටක පාලනය ගෙන යාමට සම්බන්ධවන පහත සඳහන් ආයතන තුනෙන් කෙරෙන කාර්යය ලියා දක්වන්න.

A - ව්‍යවස්ථාදායකය

B - විධායකය

C - අධිකරණය (ල: 03)

ii. පහත A, B, C, D යටතේ සඳහන් නාමයන්ගෙන් හඳුන්වන්නේ කවුරුන්දැයි පිළිවෙලින් ලියන්න.

A - අන්තේවාසික

B - සද්ධිවිහාරිය

C - ථෙර

D - භාණකවරු (ල. 04)

iii. මෙරට පැරණි සමාජයේ දියුණු දේශීය හා විදේශීය වෙළඳාමක් පැවති බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල. 05)

iv. පැරණි සමාජයේ ආර්ථිකය කෘෂිකර්මාන්තය, සත්ව පාලනය හා කර්මාන්ත ඇසුරින් උදාහරණය බැගින් සපයමින් විස්තර කරන්න. (ල. 06)

Education NCP -www.edncp.lk

06. i. ඇළහැර ඇළ මගින් ජලය සපයන වැව් තුනක් නම් කරන්න. (ල. 03)

ii. පහත A, B, C හා D මගින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - දෑදිගම ඇත් පහනෙහි අන්තර්ගත විද්‍යාත්මක මූලධර්මය

B - නිශ්ශංකමල්ල රජු ප්‍රධාන මාවත්වල ගව්වෙන් ගව්වට සිට වූ කණු

C - ගවයින්ගේ ආරක්ෂාව සඳහා සබරගමු හා ඌව පළාත්වල සිදු කරනු ලැබූ ශාන්ති කර්මය

D - යකඩ නිස්සාරණය සඳහා අවශ්‍ය වූ අඟුරු ලබා ගැනීමට යොදාගත් ශාක වර්ගය (ල. 04)

iii. පහත A හා B මගින් දක්වා ඇති වැවකට අයත් අංග මගින් කෙරෙන කාර්යය සඳහන් කර එහි තාක්ෂණය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

A - වැව් බැම්ම B - සොරොව්ව (ල. 05)

iv. අනුරාධපුර යුගයේ දී මෙරට දියුණු ගෘහ නිර්මාණ ශිල්පයක් පැවති බව උදාහරණ තුනක් ඇසුරින් විස්තර කරන්න.

(ල. 06)

## III - කොටස

07. i. අතීත සමාජ ධූරාවලියේ " කුඩීන් " ලෙස හැඳින් වූ ජන කොටස් තුනක් නම් කරන්න. (ල. 03)

ii. බදු නීතිය යටතේ පහත බදු වර්ග අය කරන ලද්දේ කුමන කටයුත්තක් සඳහා දැයි අනුපිළිවෙලින් නම් කරන්න.

A - දකපති

B - මතරමජිබක

C - බොජකපති

D - කෙටු කනබ (ල. 04)

iii. පුරාණ කාලයේ සිට ශ්‍රී ලාංකීය කාන්තාවට සමාජයේ ගෞරවණීය ස්ථානයක් හිමි ව තිබූ බව නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 05)

iv. අතීත රජවරු පරිසරය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග තුනක් සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 06)

08. i. දඹදෙණි යුගයට අයත් පහත සඳහන් කෘති රචනා කරන ලද පුද්ගලයන් නම් කරන්න.

A - කව්සිළුමිණ

B - සද්ධර්මරත්නාවලිය

C - පූජාවලිය (ල. 03)


ii. දෙවනි නාගරීකරණ සමයේ ආර්ථිකයේ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ල. 04)

iii. පොළොන්නරු රාජධානිය බිඳවැටීමට බලපෑ හේතු දෙකක් සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

iv. දෙවන පරාක්‍රමබාහු රජුගේ සේවාවන් තුනක් සඳහන් කර කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

***

Education NCP - www.ednncp.lk



Education NCP - www.edncp.lk

## ඉතිහාසය I

## ලකුණු දීමේ පටිපාටිය


| ප්‍රශ්න අංකය | පිටු අංකය | ශ්‍රේණිය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 2 | 10 | 4 |
| 02 | 2 | 10 | 2 |
| 03 | 4 | 10 | 3 |
| 04 | 4 | 10 | 4 |
| 05 | 5 | 10 | 1 |
| 06 | 10 | 10 | 1 |
| 07 | 13 | 10 | 3 |
| 08 | 13 | 10 | 2 |
| 09 | 24 | 10 | 4 |
| 10 | 20 | 10 | 3 |
| 11 | 33 | 10 | 1 |
| 12 | 23 | 10 | 2 |
| 13 | 36 | 10 | 1 |
| 14 | 40 | 10 | 3 |
| 15 | 25 | 10 | 3 |
| 16 | 46 | 10 | 4 |
| 17 | 47 | 10 | 1 |
| 18 | 46 | 10 | 2 |
| 19 | 49 | 10 | 3 |
| 20 | 51 | 10 | 1 |

| ප්‍රශ්න අංකය | පිටු අංකය | ශ්‍රේණිය | පිළිතුර |
|---|---|---|---|
| 21 | 53 | 10 | 2 |
| 22 | 53 | 10 | 3 |
| 23 | 59 | 10 | 1 |
| 24 | 64 | 10 | 4 |
| 25 | 71 | 10 | 4 |
| 26 | 73 - 74 | 10 | 2 |
| 27 | 73 - 74 | 10 | 3 |
| 28 | 63 | 10 | 2 |
| 29 | 67 | 10 | 4 |
| 30 | 78 | 10 | 1 |
| 31 | 80, 81, 82 | 10 | 3 |
| 32 | 80, 81, 82 | 10 | 1 |
| 33 | 80, 81, 82 | 10 | 2 |
| 34 | 95 | 10 | 4 |
| 35 | 85 | 10 | 3 |
| 36 | 86 | 10 | 2 |
| 37 | 97 | 10 | 3 |
| 38 | 98 | 10 | 4 |
| 39 | 100 | 10 | 1 |
| 40 | 100 | 10 | 1 |

## භූගෝල විද්‍යාව II

## ලකුණු දීමේ පටිපාටිය

01. (අ) (i)



(ii) A - මහානාම හිමි (1 පාඩම - පිටු අංකය 2)

B - ඔලගම් (2 පාඩම - පිටු අංකය 25)

C - එල්ලංගාව / වැව් ප්‍රපතනය (3 පාඩම - පිටු අංකය 35)

D - සිත්තාරුබිම බුදල්නා / බුද්ධරාජ (3 පාඩම - පිටු අංකය 41)

E - නිශ්ශංකමල්ල (4 පාඩම - පිටු අංකය 53)

F - නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා (6 පාඩම - පිටු අංකය 83)

(ආ) A - (i) කෝලෝඩියස් ටොලමි

(ii) ග්‍රීක රෝමානුවෙක්

(iii) ඇලෙක්සැන්ඩ්‍රියාව

(iv) භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය (1 පාඩම - පිටු අංකය 3)

B - (i) ඉබ්බන්කටුව සුසානය

(ii) ක්‍රි. පූ. 700 - 450

(iii) ආදාහන කටයුතු සඳහා

(iv) ප්‍රභූවරුන් සඳහා (3 පාඩම - පිටු අංකය 34)

C - (i) වර්ණාලේපිත මැටි බඳුන

(ii) උඩරංචාමඩම

(iii) සකපෝරුව

(iv) රතු පැහැති ගුරුගල් (2 පාඩම - පිටු අංකය 23)

02. (i) ලෙන් ලිපි, ටැම් ලිපි, පුවරු ලිපි, ගිරි ලිපි ආදී (1 පාඩම - පිටු අංකය 3)

(ii) ඇඳුම් පැළඳුම්, ආභරණ, කොණ්ඩ මෝස්තර, රූපලාවන්‍ය කටයුතු (1 පාඩම - පිටු අංකය 5)

(iii) ආරක්ෂා කිරීමට

- ⋆ නීති පැනවීම
- ⋆ ජනතාව දැනුවත් කිරීම
- ⋆ සිසුන් දැනුවත් කිරීම
- ⋆ ප්‍රදර්ශන, පෝස්ටර්, චිත්‍ර තරඟ ආදිය (1 පාඩම - පිටු අංකය 7)

(iv)
- ⋆ ඓතිහාසික කාල අනුපිළිවෙලින් සකස් කරගත හැකි වීම
- ⋆ විදේශීය සම්බන්ධතා අධ්‍යයනය කිරීම
- ⋆ එක් මූලාශ්‍රයකින් ලැබෙන තොරතුරු තවත් මූලාශ්‍රයකින් තහවුරු කරගැනීම

(1 පාඩම - පිටු අංකය 3)

03. (i) A - අර්ධ ශුෂ්ක කලාපය

B - පහතරට වියළි කලාපය

C - තෙත් කලාපය (2 පාඩම - පිටු අංකය 11)

(ii) ★ පිළිස්සූ මැටි බඳුන් භාවිතය
★ යකඩ මෙවලම් භාවිතය
★ ස්ථිර නිවාස ඉදිකිරීම
★ කෘෂි කර්මාන්තය (2 පාඩම - පිටු අංකය 19)

(iii) ★ සංචාරක ජීවිතයක් ගත කිරීම
★ කුඩා කණ්ඩායම් ලෙස ජීවත් වීම
★ ගල් මෙවලම් භාවිතය
★ සතුන් දඩයම් කිරීම (2 පාඩම - පිටු අංකය 14)

(iv) ★ වැව් කේන්ද්‍ර කරගෙන ගම්මාන බිහි වීම
★ විවිධ වෘත්තිකයන් අනුව ගම් බිහි වීම
★ කාර්යය පදනම් කරගෙන ගම් බිහි වීම (2 පාඩම - පිටු අංකය 24)

04. (i) A - තීර්තය අනුභව කරන්නා (3 පාඩම - පිටු අංකය 31)
B - නැගෙනහිර ප්‍රාදේශීය පාලකයා (3 පාඩම - පිටු අංකය 36)
C - නරයින්ට ඊශ්වර (3 පාඩම - පිටු අංකය 39)

(ii) ★ ජලය සංරක්ෂණය කිරීම
★ ඇළ මාර්ග දෙපස නිරන්තරයෙන් තෙතමනය ආරක්ෂා කරගැනීම (3 පාඩම - පිටු අංකය 34)

(iii) ★ ජය ශ්‍රී මහා බෝධිය රෝපණය කිරීම
★ බෞද්ධාගම ශ්‍රී ලංකාවට හඳුන්වා දීම
★ ශ්‍රී මහා බෝධියේ අංකුර විවිධ ප්‍රදේශවල රෝපණය කිරීම
★ වෙහෙර විහාර ඉදිකිරීම
★ විධිමත් රාජාභිෂේක උත්සව පැවැත්වීම (3 පාඩම - පිටු අංකය 37)

(iv) දේශපාලන - ★ රට එක්සේසත් කිරීම
★ පළාත් බෙදා පරිපාලනය විධිමත් කිරීම
★ ක්‍රමවත් ලෙස බදු අය කිරීම

ආර්ථික - ★ විශාල වැව් ඉදිකිරීම
★ උමං ජල තාක්ෂණය

ආගමික - ★ යාපනයේ පියංගුකතිස්ස විහාරය ඉදිකරවීම
★ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම
★ භික්ෂූන් වහන්සේලාට සිව් පසග ලබාදීම (3 පාඩම - පිටු අංකය 41)

05. (i) A - නීති සම්පාදනය කිරීම
B - නීති ක්‍රියාත්මක කිරීම
C - යුක්තිය පැසඳලීම (4 පාඩම - පිටු අංකය 44)

(ii) A - නායක භික්ෂුව යටතේ වැඩ වාසය කළ භික්ෂූන්
B - නායක ස්වාමීන් වහන්සේ සමීපයේ වැඩ වාසය කළ භික්ෂූන්
C - නායක ස්වාමීන් වහන්සේ
D - දහම් කරුණු මතකයේ තබාගත් භික්ෂූන් වහන්සේලා (4 පාඩම - පිටු අංකය 55)

(iii) දේශීය -
★ වෙළෙඳපොල පාලනය පිළිබඳ නීති පැනවීම (හෝපිටිගම)
★ අනුරාධපුර කාලසුමන නම් වෙළෙඳපොල
★ සීගිරියෙන් සියඹලා වෙළෙන්දෙකු පිළිබඳ සඳස්වීම

(4 පාඩම - පිටු අංකය 51)

විදේශීය -
★ විදේශ වෙළෙඳ සංවිධාන
★ ලෝහ මුද්‍රා හමුවීම
★ විවිධ කාසි හමු වීම
★ රටපුරා වරායන් පැවතීම (4 පාඩම - පිටු අංකය 53)

(iv) කෘෂි කර්මාන්තය -
★ ගොඩ ගොවිතැන (හේන්)
★ මඩ ගොවිතැන (කුඹුරු) (4 පාඩම - පිටු අංකය 47)

සත්ත්ව පාලනය -
★ ගෝවාල ගම්
★ පස්ගෝ රස පිළිබඳ
★ කිරිගෙරි වචනය
★ ස්වභාවිකව මියගිය එළුවන්ගේ හා කුකුළන්ගේ මස්

(4 පාඩම - පිටු අංකය 50)

කර්මාන්ත -
★ ලෝහ (යකඩ, තඹ, රන්)
★ මැණික්
★ මැටි
★ ඇත්දත් (4 පාඩම - පිටු අංකය 50)

06. (i) මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල, කන්තලේ (5 පාඩම - පිටු අංකය 67)

(ii) A - දැදිගම ඇත් පහනේ - අචල ජල විද්‍යාත්මක මූලධර්මය (5 පාඩම - පිටු අංකය 76)
B - ගාවුත කණු (5 පාඩම - පිටු අංකය 74)
C - කිරිමඩු ශාන්ති කර්මය (5 පාඩම - පිටු අංකය 72)
D - යකඩ මරං / මරං (5 පාඩම - පිටු අංකය 72)

(iii) වැව් බැම්ම හා සොරොව්ව පිළිබඳ නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.

(5 පාඩම - පිටු අංකය 66)

(iv)
★ මහා ස්තූප සෑදීම
★ චෛතියඝර
★ බෝධිඝර
★ සීගිරි බලකොටුව
★ රුවන්වැලිසෑයේ අත්තිවාරම (5 පාඩම - පිටු අංකය 68)

07. (i) ගොවියන්, එඬේරුන්, වළං සාදන්නන්, මැණික් කපන්නන්, කම්මල්කරුවන්, ධීවරයන්

(6 පාඩම - පිටු අංකය 79)

(ii) A - වැවේ ජලය භාවිතා කිරීම වෙනුවෙන් අයකළ බද්ද

B - ඇළ මාර්ගවලින් මත්ස්‍යයින් ඇල්ලීම වෙනුවෙන් අයකළ බද්ද

C - රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් අයකළ බද්ද

D - හේන් වගා කිරීම වෙනුවෙන් අයකළ බද්ද (6 පාඩම - පිටු අංකය 81)

(iii) ★ රාජ්‍ය පාලනයට සම්බන්ධ වීම

★ සූප ශාස්ත්‍රයේ දක්‍ෂයින් වීම

★ මච්චරුන් ලෙස විශාල වගකීමක් දැරීම

★ ප්‍රාදේශීය පාලනයට සම්බන්ධ වීම (6 පාඩම - පිටු අංකය 85)

(iv) ★ කැළෑ හෙළිපෙහෙලි කිරීම වැළැක්වීම සඳහා පැනවූ නීති

★ සතුන් ආරක්‍ෂා කිරීම සඳහා පනවන ලද නීති

★ පස ආරක්‍ෂා කරගැනීම සඳහා පනවන ලද නීති (6 පාඩම - පිටු අංකය 89)

08. (i) A - II පරාක්‍රමබාහු රජු

B - ධර්මසේන හිමි

C - මයුරපාද පරවේනාධිපති බුද්ධ පුත්‍ර හිමි (7 පාඩම - පිටු අංකය 104)

(ii) ★ කෘෂි කර්මාන්තය සඳහා අහස් දිය යොදා ගැනීම

★ ජල හිඟ ප්‍රදේශවල හේන්වල වගා කිරීම

★ වාණිජ ආර්ථිකයකට නැඹුරු වීම

★ බෝගවල අතිරික්තය වෙළෙඳාම සඳහා යොමු කිරීම

★ විදේශ වෙළෙඳාම වර්ධනය වීම

★ කුරුඳු ප්‍රධාන වෙළෙඳ බෝගයක් වීම (7 පාඩම - පිටු අංකය 96)

(iii) ★ දුර්වල පාලනයන් බලයට පත්වීම

★ කාලිංග පාණ්ඩ්‍ය බල අරගලය

★ කාලිංග මාඝ ආක්‍රමණ

★ ආර්ථිකය පරිහානිය (7 පාඩම - පිටු අංකය 96)

(iv) ★ කාලිංග මාඝ පරාජය කිරීම

★ චන්ද්‍රභානුගේ ආක්‍රමණවලට මුහුණ දීම

★ දේවපතිරාජ ලවා රට සංවර්ධනය කිරීම

★ සාහිත්‍ය දියුණුවට කටයුතු කිරීම (7 පාඩම - පිටු අංකය 98)